# <u>යෝජිත "අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපළ පිළිබඳ පනතේ"</u>

# <u>ප්‍රතිපත්තිමය හා නීතිමය රාමුව- මූලික විධිවිධාන</u>

*<u>පසුබිම</u>*

අල්ලස හා දූෂණය හේතුවෙන් සෑම වසරකම ඇ.ඩො.බිලියන 20ත් 40ත් අතර ප්‍රමාණයක් දියුණු වෙමින් පවතින රටවල් වෙතින් ගිලිහී යයි. සාමාන්‍යයෙන්, මෙලෙස අහිමි වන මුදල් සැඟව පවතින්නේ විදේශීය මූල්‍ය මධ්‍යස්ථානවල වන අතර, එමගින් එම අරමුදල්, උත්පාදිත රටේ මහජන සුභසිද්ධිය සඳහා යොදාගැනීමට ඇති අවස්ථාව මගහැරේ. දූෂණය මැඩලීමේ යාන්ත්‍රණයන් ඇතිකිරීමට හා නීතිවිරෝධී මූල්‍ය ගලායාම් නැවැත්වීමට , රාජ්‍යයන් අන්තර්ජාතික වශයෙන් බැඳී සිටී.

එක්සත් ජාතීන්ගේ දූෂණය පිටුදැකීමේ සම්මුතියට (UNCAC) අත්සන් තබන ලද රාජ්‍යයක් වශයෙන්, අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපළ මාරු කිරීම වැලැක්වීම හා එවන් දේපල නැවත ලබාගැනීම වෙනුවෙන් අන්තර්ජාතික සහයෝගය ලබාදීමට ශ්‍රී ලංකාවට වගකීමක් ඇත.

ඒ අනුව 2015දී ලන්ඩන්හි පැවැති දූෂණ විරෝධී සමුළුවේදී හා 2017 දී පැවති වත්කම් නැවත ලබාගැනීම පිලිබඳ ගෝලීය සංසදයේදීද(GFAR), ශ්‍රී ලංකාව විසින් අවධාරණය කල කරුණක් වන්නේ සොරාගන්නා ලද වත්කම් නැවත ලබාගැනීමට මූලිකත්වය දීමට ඇති වගකීමයි.

වත්කම් නැවත ලබාගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා (එනම්, සොරාගත් දේපළ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට,හඳුනාගැනීමට, අනාවරණය කිරීමට ,අත්පත් කරගැනීමට හා සොරාගත් වත්කම් නැවත ශ්‍රී ලංකාවට ලබාගැනීමට) පත්කරන ලද ආයතනය වන "වත්කම් නැවත ලබාගැනීමේ විශේෂ ජනාධිපති කාර්ය බලකාය"( START) විසින් 2018 දී, අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් සැකසීම සඳහා කමිටුවක් පත්කරන ලදී.

2018 වර්ෂය අවසන් වන විට එම කාර්යය සම්පූර්ණ කෙරුණු අතර, මෙහි දැක්වෙන රාමුවෙන් ඉදිරිපත් කර ඇත්තේ එම උත්සාහයේ ප්‍රතිඵලයකි. තවද මෙම ප්‍රතිපත්ති මාලාව නීතියක් බවට පරිවර්තනය කරගැනීමේ අභිප්‍රායයෙන් මෙය අතිගරු ජනාධිපතිතුමා හටද පිළිගන්වන ලදී.

# <u>ප්‍රතිපත්තියෙහි අන්තර්ගතය</u>

*<u>යෝජිත නීතියේ අරමුණු</u>*

- අපරාධකරුවන්හට අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළවල හිමිකාරීත්වය අහිමි කිරීම.

- අපරාධයක වින්දිතයන්හට වන්දි ලබාදීම.

- සංවිධානාත්මක අපරාධ අකර්මන්‍ය කිරීම.
  (උදා: ත්‍රස්තවාදය,මූල්‍ය හා ආර්ථිකමය අපරාධ)

- අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ පිළිබඳව ආර්ථික වශයෙන් සාධනීය වූ වැඩපිළිවෙලක් සකස් කිරීම.

- අත්පත්කරගන්නා ලද/රාජසන්තක කරන ලද වත්කම් රාජ්‍යයයේ, සමාජයේ හා වින්දිතයන්ගේ සුභසිද්ධිය සඳහා සුරක්ශිත කිරීම.

- අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ නැවත ලබාගැනීමේ ක්‍රමවේදය තුල වගවීම, විනිවිදභාවය හා මහජන විශ්වාසය ඇති කිරීම.

*<u>යෝජිත නීතිය අදාළ වන්නේ....</u>*

- ශ්‍රී ලංකාව තුල අපරාධය සිදුකර ඇති විට.

- පුරවැසියෙක්,ද්විත්ව පුරවැසියෙක් හෝ ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු විසින්, ශ්‍රී ලංකාව තුලදී හෝ ඉන් පිටත අපරාධයක් සිදුකොට ඇති විට හා එම අපරාධයෙන් ව්‍යුත්පන්න වන දේපළ ශ්‍රී ලංකාව තුලදී හෝ ඉන් පිටතදී හමුවූ විට.

- අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපල ශ්‍රී ලංකාව තුල සොයා ගත් විට හෝ එවැනි දේපල ශ්‍රී ලංකාව තුලට, ඉන් පිටතට හෝ ශ්‍රී ලංකාව හරහා ගෙන යන/එන අවස්ථාවකදී

*<u>යෝජිත නීතිය පහත කාරණා සම්බන්ධයෙන් බලපවත්වනු ඇත.</u>*

- අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ සම්බන්ධයෙන් සිදුකරන විමර්ශන

- අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ හදුනාගැනීම, සොයාගැනීම හා අනාවරණය කිරීම.

- අපරාධයකින් ව්‍යුත්පන්න වන දේපළ අත්පත්කරගැනීම, අවුරා තැබීම, රාජසන්තක කිරීම, අභිමිකරණය හා එබඳු දේපළවලට එරෙහිව නඩු පැවරීම.

- ආපසු ලබාගන්නා ලද වත්කම් කලමනාකරණය කිරිම හා බැහැර කිරීම.

- අපරාධයේ වින්දිතයන් හට හානිපූර්ණ ලබාදීම හා සද්භාවී තුන්වන පාර්ශ්වයන්ගේ අයිතීන් තහවුරු කිරීම.

- වාර්ෂිකව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සහ කාලානුරූපීව මහජනයාට වාර්තා කිරීම.

*<u>යෝජිත නීතිය තුල ඇතුලත් ප්‍රධාන විධිවිධාන කිහිපයක්</u>*

- මෙම පනතේ අඩංගු විධිවිධාන ක්‍රියාත්මක කරලීම සඳහා “ අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපළ නැවත ලබාගැනීමේ සහ කළමණාකරණය කිරීමේ ශ්‍රී ලංකාවේ අධිකාරිය” නම් වූ ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටවනු ඇත.

    - මෙම අධිකාරියට,

    අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපළ හඳුනාගැනීම,අනාවරණය කරගැනීම, විමර්ශන සිදුකිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම (වරදකරු ලෙස විනිශ්චය කිරීමකින් තොරව රාජසන්තක කිරීමද ඇතුලත්ව) යනාදී වූ නීතිබලාත්මක කිරීමේ අධිකාරියක් සතු සියලු බලතල සතුවේ.

- යම්කිසි දේපළක් හෝ ඊට  ඇති යම් අර්ථලාභීප්‍රතිලාභයක්, නීති විරෝධී ආකාරයෙන් ලබාගෙන ඇති බවට වැඩි බර සාක්ෂි මත  පෙන්වියහැකි නම්, එවැනි දේපලක් හෝ ඊට ඇති අර්ථලාභීප්‍රතිලාභයක්, වරදකරු ලෙස විනිශ්චය කිරීමකින් තොරව රාජසන්තක කිරීමට හැකියාව ඇත. එවැනි රාජසන්තක කිරීම් , අදාල පුද්ගලයාව වරදකරු ලෙස විනිශ්චය කිරීම මත පදනම් නොවේ.

- යම් පුද්ගලයෙකු අපරාධයක වැරදිකරුවකු ලෙස විනිශ්චය වූ පසු එම අපරාධයෙන් ව්‍යුත්පන්න වූ දේපළ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම අනිවාර්යය වේ.(අධිකරණය විසින් එලෙස නඩුමාර්ගයට එලඹීමේ අයිතිය අත්හැර නැත්නම් පමනක්)

- යම් පුද්ගලයෙකු සතුව පවතින වත්කම් උපයාගත් ආකාරය පැහැදිලි කල නොහැකි නම්,  එවැනි අරමුදල් වල මූලාශ්‍ර සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබාදීමට ඔහු/ඇය බැදී සිටී.

- යෝජිත නීතිය මගින්, අත්පත්කරගන්නා ලද දේපළ කළමණාකරනයට අමතරව , පහත සදහන් කාර්යයන් සිදුකිරීම සදහා විධිවිධාන සකසා ඇත.

  - කල්තබාගතනොහැකි/නාශනශ්‍රීලී බඩු බැහැර කිරීම
  - අධිකරණ ක්‍රියාවලිය සිදුවන අතරවාරයේදී වත්කම් කලමනාකරණය කිරීම.
  - රාජසන්තක නොවූ භාණ්ඩ  නිදහස් කිරීම.
  - දේපල අත්පත්කරගැනීම සම්බන්ධයෙන් ඇති හිමිකම් නඩු සමථකරණය.

- රාජසන්තක වූ දේපළ භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන භාරකාර අරමුදලක් වෙත මාරුකලයුතුය.(රාජසන්තක කරන ලද, අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපලක් භාර අරමුදල)

- භාරකාර මණ්ඩලය සැදුම්ලත් වන්නේ, යුක්තිය පසිඳලීම,නීති බලාත්මක කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය,ව්‍යාපාර කළමනාකරණය, සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය සහ විගණනය යනාදී විෂයයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමැති පිළිගත් පුද්ගලයන්ගෙනි.එමෙන්ම එම සාමාජිකයන් පත්කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගිනි.

- භාරකාර අරමුදල යොදාගත හැක්කේ පහත කාර්යයන් සඳහා පමණි.

- නීතිය බලාත්මක කිරීම හා යුක්තිය පසිඳලීම ශක්තිමත් කිරීම.

- අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතීන් හා හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

- අපරාධ වැලැක්වීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම සඳහා.

- මෙම නීති ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන නිලධාරීන්හට දිරිගැන්වීම් ලබාදීමට.

- තොරතුරු සපයන්නන් වෙනුවෙන් දිරිදීමනා ලබාදීමේ අරමුදල ශක්තිමත් කිරීමට.

- තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා.

- භාරකාර අරමුදලේ කළමනාකරණ කටයුතු විනිවිදභාවයකින් හා මහජන අධීක්ෂණයක් යටතේ සිදුවිය යුතු අතර මෙහි ගිණුම් පොදු විගණන ක්‍රියාවලියට යටත් විය යුතුය.

- අත්පත්කරගත් දේපලක් සාධාරණ කාල පරිච්ඡේදයක් තුලදී රාජසන්තක කරගැනීමට නීතිමය පියවර නොගතහොත් එම දේපල නැවත එහි හිමිකාරීත්වය දරණ පුද්ගලයන් හට ලබා දියයුතුය.

- අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපලක් තුලින් යම්කිසි හානිපූර්ණයක්/වන්දියක් ලබාගෙන තිබීම, එම අපරාධය හා සම්බන්ධ  සිවිල් නඩුවකදී අලාභ  හා වන්දි ලබාගැනීමට ඇති බාධකයක් නොවේ.

- අපරාධයකින් ව්‍යුත්පන්න වූ දේපලක් සම්බන්ධයෙන් තොරතුරු ලැබීමට අවස්ථාව ඇති පුද්ගලයන් හට එම තොරතුරු වාර්තා කිරීමට යුතුකමක්  පනවා ඇත.

- යෝජිත නීතිය ක්‍රියාත්මක කිරීමේදී හා අර්ථනිරූපණය  කිරීමේදී පහත සදහන් මගපෙන්වීමේ මූලධර්ම වලට අනුගත විය යුතුය.

    - අපරාධ යුක්තියේ අරමුණු සාක්ශාත් කරගැනීම

    - අවශ්‍යතාව

    - සමානුපාතික බව

    - පොදු යහපත